පදවිශ්‍රීපුර ප්‍රාදේශීය සභාව
ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
-------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 27 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින දසභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පදවිශ්‍රීපුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
--------------------------

| | ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැටුප් ප්‍රතිපූර්ණ ලැබිය යුතු රු.3,266,858 ක් ගිණුම්වලින් මඟහැරී තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | නිලධාරියෙකු විසින් කන්තලේ ප්‍රාදේශීය සභාවෙන් ලබාගත් ආපදා ණය මුදල පදවිශ්‍රීපුර ප්‍රාදේශීය සභාවේ සේවක ණය ගිණුම තුළ ඇතුළත් වීමෙන් එම ගිණුමේ ශේෂය රු.245,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | කර්මාන්ත දෙකක් වෙනුවෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු.1,982,058 මුදල ගිණුම්ගත කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කළ යුතු වේ. | 2018 වර්ෂයේ දී PSDG ප්‍රතිපාදන මඟින් සිදු කරනු ලැබූ කර්මාන්ත සඳහා 2019 වර්ෂයේ මුදල් ප්‍රතිපූර්ණ ලැබී ඇති බැවින් එම මුදල් 2018 වර්ෂයේ ගිණුම් සඳහා ඇතුළත් කර නැත. එය 2019 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ජල සැපයුම් ගබඩාවේ සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට වූ රු.346,304 ක තොගය අවසන් තොගවලින් මගහැරී තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කළ යුතු වේ. | ජල සැපයුම් ගබඩාවේ තොග ශේෂය අවසන් ගිණුම් සකස් කිරීමේ දී ශේෂ කර නොතිබූ බැවින් ගිණුමේ අවසන් තොග වලින් මග හැරී ඇත. එය මේ වන විට ශේෂ කර අවසන් කර ඇති බැවින් 2019 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඉ) | නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ සමාලෝචිත වර්ෂයේ අවසානයට වූ රු.195,632 ක තොගය අවසන් තොග ගිණුමෙන් මගහැරී තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කළ යුතු වේ. | නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ තොග ශේෂය අවසන් ගිණුම් සකස් කිරීමේ දී ශේෂ කර නොතිබූ බැවින් ගිණුමේ අවසන් තොග වලින් මග හැරී ඇත. එය 2019 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඊ) | අවස්ථා 06 කදී බාහිර ආයතනවලින් ලබාගත් සේවාවන් සඳහා ගෙවිය යුතු රු.146,504 ක වටිනාකම සඳහා ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |
| (උ) | ලෙජර් ගිණුම් අනුව ජල ඇප තැන්පතු මුදල රු.158,000 ක් හා කඩකාමර ඇප තැන්පතු රු.216,270 ක් තැන්පතු ශේෂවලින් මගහැරී තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කළ යුතු වේ. | ලෙජර් ගිණුම් සඳහා ජල ඇප තැම්පතු මුදල හා කඩ කාමර ඇප තැම්පතු මුදල සඳහන් කිරීම මග හැරීමක් සිදු වී එය 2019 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

1.3.2 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.162,793,343 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | රු.4,350,676.91 ක වටිනාකමට අදාළව ස්ථාවර වත්කම් පිළිබඳ අවශ්‍ය තොරතුරු මේ වන විට සකස් කර අවසන් බවත්, ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කිරීම ආරම්භ කර ඇත්තේ මෑත කාලීනව වීම හේතුවෙන් දීර්ඝ කාලයක් සිට පවතින වත්කම්හි තොරතුරු සභාව සතු පැරණි ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඉදිරියේ දී සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |

1.4 අනුකූල නොවීම

නීතී, රීතී. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීතී, රීතී. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීතී මාලාව | | | |
| | (i) 217 වැනි රීතිය | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ PS46 ආකෘතිය ප්‍රකාරව ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ ලේඛනය මේ වන විට යාවත්කාලීන කරමින් පවතී. |
| | (i) 218 වැනි රීතිය | සභාවේ දේපල සම්බන්ධව සෑම වර්ෂයකට වරක් සමීක්ෂණයක් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී සමීක්ෂණ කටයුතු සිදු කරනු ලබන බව දන්වා සිටිමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 880 | ඇප තැබිය යුතු නිලධාරීන් 07 දෙනෙකු විසින් සේවක ඇප මුදල් තැන්පත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඇප තැබිය යුතු නිලධාරීන් සඳහා 2019 වර්ෂයේ දී ඇප මුදල් තැම්පත් කිරීම් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සකස් කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2002 නොවැම්බර් 11 දිනැති අංක AI/2002/2 දරන මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | පරිගණක පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | පරිගණක පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව නඩත්තු කළ යුතු වේ. | පරිගණක සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනයේ පැරණි පරිගණක පිළිබඳ තොරතුරු අන්තර් ගත කර ඇති අතර අලුතින් මිලදී ගන්නා ලද පරිගණක ඇතුළත් කිරීම මග හැරීමක් සිදු වී ඇත. එම ලේඛන නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

2. මූල්‍ය සමාලෝචනය
---------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,185,706 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.321,380 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
-------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්
-------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 1,100 | 1,083 | 1,110 | 96 | 1,147 | 1,321 | 1,233 | 57 |
| කුලී | - | - | - | - | 7,000 | 7,343 | 7,078 | 1,168 |
| බලපත්‍ර ගාස්තු | 478 | 457 | 472 | _ | 483 | 856 | 673 | 183 |

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ජලබිල් හිඟය රු.1,168,000 ක් වූ අතර මෙම හිඟ මුදලින් රු.903,000 ක් ඉකුත් වර්ෂවලට අදාල විය. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සමාලෝචිත වර්ෂයේ ජල බිල් හිඟ ආදායම 2019 වර්ෂයේ දී අය කර ගැනීමට කටයුතු කර ඇත. |

2.2.3 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.182,550 ක් වූ බලපත්‍ර හිඟය අයකර ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම හිඟ ආදායම අය කර ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන කාර්යයන් සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් කාරණා 05 කට අදාළව 2013 වර්ෂයේ දී සකස් කර තිබූ අතුරු ව්‍යවස්ථා අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රධාන කාරණා 28ක් සඳහා අතුරු ව්‍යවස්ථා පැනවීම සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙත ලිපි ලේඛන යවා ඇති බවත්, 2019/05/28 දින පැවැත්වීමට නියමිත විශේෂ සභා රැස්වීමෙන් අනුමත කිරීමෙන් අනතුරුව පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙත නැවතත් යැවීමට කටයුතු කරනු ලබන බවත්, ඉතිරි කාරණා සඳහා ඉදිරියේ දී අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බවත් දන්වා සිටිමි. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කසල බැහැර කිරීමේ දී මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට අනුව කසල බැහැර කිරීම සිදු කර නොතිබුණි. කසල බැහැර කරනු ලබන පදවි ශ්‍රීපුර කෝට්ටල් වස්න එක් පසකින් වෙල් යායටද අනෙක් පසින් ස්වභාවික ඇළ මාර්ගයකටද මැදිව පවතින අතර අධික වර්ෂා සමයේ දී ඇළ මාර්ගයට හා කුඹුරුවලට කසළ එක්වන අතර පොලිතීන්, ප්ලාස්ටික් ඇතුළු අනෙකුත් කසල ගිනිතබා විනාශ කරමින් පැවතුණි. | මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට අනුකූලව කසල බැහැර කිරීම කළ යුතු වේ. | මීළඟට පැවැත්වීමට නියමිත සභා වාරයක දී යෝජනා සම්මත කර ගැනීමෙන් අනතුරුව කසළ බැහැර කිරීමේ ස්ථානය වෙනස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සිදු කිරීමට අපේක්ෂා කර ඇත. |

(ඈ) පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 "අ" වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පාරිසරික හානි සිදු වන වී මෝල්, වඩු කර්මාන්ත සහ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන 21 ක් පරිසර බලපත්‍ර ලබා ගැනීමකින් තොරව කර්මාන්ත පවත්වා ගෙන යමින් තිබුණි. | බලපත්‍ර ලබාගත යුතු ව්‍යවසායන් හඳුනාගෙන බලපත්‍ර නිකුත් කිරීම හා පරිසර ගැටළු නිරාකරණය කළ යුතු වේ. | මේ සඳහා ලිපි මඟින් සිහි කැඳවීම් ද සහිතව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇති අතර ඉදිරි සභා වාරයක දී යෝජනා සම්මත කර ගැනීමෙන් අනතුරුව තවදුරටත් ගත යුතු ක්‍රියා මාර්ග සම්බන්ධව කටයුතු කරමි. |

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ ඇතුළත් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා අදාළ නිර්නායක පිළිබඳව ප්‍රමාණවත් දැනුවත්භාවයක් නොමැති වීම හේතුවෙන් කිසිඳු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සභාව අපොහොසත්ව තිබුණි. | පනත් හා චක්‍රලේඛ ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගත හැකි පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වේ. | පරිසර සංරක්ෂණය කිරීම උදෙසා 2019 වර්ෂයට අදාළ අයවැය ලේඛනයේ ප්‍රතිපාදන වෙන් කර ඇති බවත්, දැනට කසළ බැහැර කරන ස්ථානය වෙනුවට නව ස්ථානයක් හා කසළ වෙන් කර දැමීම සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීමට අපේක්ෂා කරන බවත් දන්වා සිටිමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 නොවැම්බර් මස 17 දින රු.107,010 ක වියදමින් මිලට ගෙන තිබූ කොම්පොස්ට් බඳුන් 41 ක් බෙදා නොදී සභා පරිශ්‍රයේ ගොඩගසා තිබුණි. | කොම්පොස්ට් බඳුන් සැලසුම් කළ අයුරින් බෙදා හැරීමට කටයුතු කළ යුතු වේ. | මෙම කොම්පෝස්ට් බඳුන් පාසල් වලට ලබා දීමට කටයුතු සූදානම් කර තිබූ අතර ඒ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනකින් අනතුරුව මෙම බඳුන් බෙදා දීමට අපේක්ෂා කරගෙන සිටින බව දන්වා සිටිමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තනතුරු 08 ක පුරප්පාඩු 13 ක් පැවති අතර එක් අතිරික්තයක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්තය විධිමත් කර ගතයුතු වේ. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවය ගරු ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡා කර ඇත. ජල ව්‍යාපෘතිය සඳහා නිලධාරීන් ප්‍රමාණවත් නොවන බැවින් අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සභාවේ අනුමැතිය මත නිලධාරීන් මාස 06ක් සඳහා ආදේශක පදනම මත බඳවා ගෙන ඇති බවත් දන්වා සිටිමි. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පූර්ව වර්ෂයක සිට පැවත එන රු.180,654 ක් වූ අත්තිකාරම් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නොපිය වූ ශේෂ සම්බන්ධව පරීක්ෂණයක් පවත්වා අදාළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම අත්තිකාරම් මුදල 2013 වර්ෂයේ සිට පවතින්නක් වන අතර 2019 වර්ෂයේ දී එය නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා සිටිමි. |

3.5 වත්කම් කළමනාකරණය

3.5.1 නිෂ්ක්‍රීය/ඌණ උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවට අයත් වාහන 04 ක් හා වාහන කොටස් 01 දීර්ඝ කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි. | උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙහි දක්වා ඇති මහින්ද්‍රා කැබ් රථය අලුත්වැඩියා කිරීමේ කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරන බවත්, අත් ට්‍රැක්ටර් 02 භාණ්ඩ සමීක්ෂණය මඟින් විකිණීමට හා මාරු කිරීමට කටයුතු කරන අතර මාර්ග තලන යන්ත්‍රය හා යකඩ බවුසරය මේ වන විට සාදා නිම කර ඇති බවත් දන්වා සිටිමි. |

3.5.2 වාහන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | වාහනවල දෛනික ධාවන සටහන් එවා නොතිබුණි. | දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත යොමු කළ යුතු වේ. | මාසික දෛනික ධාවන සටහන් නියමිත දිනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (ආ) | අංක 02/2017 දරන 2012 දෙසැම්බර් 21 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවට අයත් නොවන පහත සඳහන් වාහන ....... ක් ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙහි සඳහන් වාහන දෙක සඳහා මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර ඇති අතර එම වාහනයන්හි පොත් RMV සතුව පවතින බවත්, ලීසිං කාලය අවසන් වීමෙන් අනතුරුවත් පවරා ගැනීම් සිදු කිරීමට කටයුතු කරන බවත්, අනෙකුත් වාහන ඉදිරියේ දී |

| | | |
|---|---|---|
| | | පවරා ගැනීම සඳහා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බවත් දන්වා සිටිමි. |

3.6 ප්‍රසම්පාදනය

----------------

3..6.1 ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------------- | --------------- | ------------------------ |
| නිශ්චිත විස්තර හා වටිනාකම් නොදක්වා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම විස්තරාත්මකව සකස් කළ යුතු වේ. | ප්‍රසම්පාදන සැළැස්මෙහි පවතින අඩුපාඩු සකස් කර ගැනීමට අවශ්‍ය කටයුතු ඉදිරියේ දී සිදු කරමි. |

3.6.2 සැපයීම් හා සේවා

-------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------------- | --------------- | ------------------------ |
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (අ) සහ 2.8.4 වගන්තිය ප්‍රකාරව මිලදී ගැනීම් සඳහා තාක්ෂණ ඇගයීම් කමිටුවක් පත් නොකර සමාලෝචිත වර්ෂයේ මිලදී ගැනීම් සිදු කර තිබුණි. | තාක්ෂණ ඇගයීම් කමිටුවක් පත් කළ යුතු වේ. | 2019 වර්ෂයේ සිට තාක්ෂණ කමිටුවක් පත් කර ඇත. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5.6 ප්‍රකාරව ලංසු කැඳවීමේ දී වුවද පිරිවිතරවලින් තොරව ලංසු කැඳවා තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.6.1 (අ) ii ප්‍රකාරව පිරිවිතර සමාලෝචනය කිරීමක් ද සිදු වී නොතිබුණි. | ලංසු කැඳවීමේ දී පිරිවිතර භාවිතා කළ යුතු වේ. | මින් ඉදිරියට ප්‍රසම්පාදන මාර්ගොපදේශ සංග්‍රහයේ 2.6.1 (අ) ii ප්‍රකාරව කටයුතු කරමි. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

------------------------------------------

4.1 විගණන හා කළමනාකරණ කමිටු

--------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------------- | -------------------- | ----------------------------- |
| විගණන හා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2009/6/09 දරන අංක DMA/2009 (i) දරන චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතු වේ. | සියලුම යෝජනාවන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන බැවින් විගණන හා කළමනාකරණ කමිටු පිහිටු වීමක් සිදු නොකළ බවත් ඉදිරියේ දී එම කමිටු ආරම්භ කිරීමට කටයුතු කරන බවත් දන්වා සිටිමි. |